# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report 2012

**ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය**

**இலங்கை சுற்றுலா ஹோட்டல் முகாமைத்துவ நிறுவகம்**

**Sri Lanka Institute of Tourism & Hotel Management**

# වාර්ෂික වාර්තාව
# 2012

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# පටුන


| | |
|---|---|
| ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ පණිවිඩය | 03 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | 04 |
| හැඳින්වීම | 06 |
| අපගේ දැක්ම මෙහෙවර සහ ඉලක්ක | 07 |
| සංවිධාන ව්‍යුහය | 10 |
| මණ්ඩල රැස්වීම් හා කළමනාකරණ රැස්වීම් | 11 |
| ක්‍රියාත්මක කරන ලද පුහුණු **වැඩසටහන්** හා බාහිර ක්‍රියාකාරකම් | 12 |
| වාර්ෂික ගිණුම් | 43 |
| විගණකාධිපති නිරීක්ෂණ | |

## ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ පණිවිඩය



වසර 30 ක් මුළුල්ලේ උතුරු නැගෙනහිර පැවති ගැටුම් අවසාන වීමත් සමග සංචාරක කර්මාන්තය දිවයිනේ සීග්‍රයෙන් වර්ධනය වීමට පටන්ගෙන ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව දිවයිනේ සංචාරක ප්‍රවර්ධනය ප්‍රධාන අරමුණකි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා, 2016 වන විට සංචාරකයින්ගේ පැමිණීම දසලක්ෂ 2.5 ක් දක්වා වැඩි කරගැනීමටත්, කාමර ධාරිතාව 12,500 සිට 45,000 දක්වා වැඩි කරගැනීමටත් සැලසුම්කර ඇත.

සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයත් සමග දිවයිනට පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සැපයීමට කාර්මික මට්ටමේ සහ කළමනාකරණ මට්ටමේ පුහුණු වෘත්තිකයන් ක්ෂේත්‍රයට අවශ්‍යව ඇත. එයට ගැලපෙන පරිදි කාර්මික, මධ්‍යම සහ කළමනාකරණ මට්ටමේ වෘත්තිකයන් 60,000 ක් සත්කාරක ක්ෂේත්‍රය සඳහා පුහුණු කිරීමේ අභියෝගාත්මක කාර්යයේ යෙදීසිටින එකම රජයේ අනුමත ආයතනය ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය වේ. පවතින සම්පත් ප්‍රයෝජනයට ගනිමින් මෙම අසීරු අරමුණ කරා ළඟාවෙමින් පවතින බව 2012 වසරේ වාර්ෂික වාර්තාවෙන් පෙන්නුම් කෙරේ. කෙසේ නමුත් මෙම අරමුණ සීමිත කාලපරාසයක් තුල සාක්ෂාත් කරගැනීම සඳහා අප්‍රතිහත උනන්දුව සහිතව නව උපායමාර්ග ක්‍රියාත්මක කළයුතුව ඇත.

ග්‍රාමීය ජනතාවගේ දරිද්‍රතාව අඩුකිරීම සඳහා අපගේ රජය විසින් සංචාරක හා සත්කාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනයේ ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාව වෙත, විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල් වෙත ගලායාමට සලස්වා ඇත. මේ අනුව ග්‍රාමීය තරුණ තරුණියන්ට සත්කාරක ක්ෂේත්‍රයේ ඵලදායී රැකියා ලබාගැනීමට හැකිවන අයුරින් පුහුණුවීමේ අවස්ථාව සලසා ඇත. දේශීය හා ජාත්‍යන්තර උසස් අධ්‍යාපන ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම තුලින් ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය වාර්ෂික පුහුණුකිරීම් සඳහා බඳවාගන්නා ලද සංඛ්‍යාව වැඩිකිරීමට 2012 වසරේදී පියවර ගෙන ඇත.

සත්කාරක ක්ෂේත්‍රයේ පුහුණුව සඳහා ඇතුළුවන තරුණ තරුණියන්ට ස්ථිර සහ ආර්ථිකමය වශයෙන් පැහැබර අනාගතයක් හිමිවන බව විශ්වාස කරමි. සත්කාරක ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා දරන අතීත හා වර්තමාන උත්සාහයන් නිසා ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය ආසියාව විශිෂ්ටතම පුහුණුකිරීමේ මධ්‍යස්ථානය බවට පත්වීමට හැකිවේවායි ප්‍රර්ථනා කරමි.

ගරු බැසිල් රාජපක්ෂ මහතා (පා.ම.)
ආර්ථික සංවර්ධන අමාත්‍ය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය



ආගන්තුක සත්කාර සැලැසීමේ ගුණාංගයෙන් යුක්තවීම හේතුකොටගෙන අන්තර්ජාතික වශයෙන් කීර්තියක් අත්කරගැනීම සුවිශේෂී ලක්ෂණයක් වීමත්, කල්පිටිය, ත්‍රිකුණාමලය, පාසිකුඩා සහ කල්කුඩා වැන නිකේතන ගමනාන්ත ශීඝ්‍රයෙන් පුළුල් වීමත් නිසා, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතන අප ශිෂ්‍යයන් සඳහා පෙර නොවූ විරූ අන්දමේ වර්ධනයක් පෙන්නුම් කරනු ලබන කර්මාන්තයක තරඟකාරී මෙන්ම වාසිසහගත නව මංපෙත් විවර කිරීම සඳහා පවතින අවස්ථා සම්බන්ධයෙන් නිරන්තරයෙන් සොයා බලමින් සිටී. වර්ෂ 2016 වනවිට මෙරටට සංචාරකයින් මිලියන 2.5 ක පැමිණීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා තුළ පවතින දැක්මත් ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, නියෝජ්‍ය අමාත්‍යය ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා සහ අමාත්‍යාංශ ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මැතිතුමා යන අයගේ මගපෙන්වීමත් මත ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය කළමනාකරණ සහ ශිල්පීය මට්ටමේ මිනිස්බල අවශ්‍යතා සපුරාලීම උදෙසා එය සතු සියලුම ශක්තීන් අඛණ්ඩව යොදවමින් සිටී.

කොළඹ පිහිටි අපගේ ප්‍රධාන පාසැල සහ මහනුවර, රත්නපුරය, අනුරාධපුරය, බණ්ඩාරවෙල සහ කොග්ගල යන ප්‍රදේශවල පිහිටා තිබෙන අපගේ පළාත් පාසැල් 5 මගින් වාර්ෂිකව සිසුන් 1200 කට ආසන්න ප්‍රමාණයක් පුහුණු කරනු ලැබේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සංචාරක සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලදුව මෑතකදී පල්ලෙකැලේදී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ශිල්ප පුහුණු පහසුකම් ආයතනය නිසා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට එහි ඉතිහාසයේ පළමුවරට කොළඹින් බැහැරව කළමනාකරණ මට්ටමේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට හැකිවිය.

ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය සඳහා දේශීයව මෙන්ම අන්තර්ජාතික වශයෙන් අවශ්‍යවන නවීන දැනුම සහ කුසලතා අපගේ ශිෂ්‍යයින්ට ලබා දීම පිණිස ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය තම අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක භාවය වර්ධනය කිරීමට ඉමහත් ප්‍රයත්නයක් දරනු ලබයි. රටේ සංවර්ධන අවශ්‍යතාවන් සපුරාලනුවස් අපගේ පාඨමාලා අන්තර්ගතයන් සහ ඉගැන්වීම් ක්‍රමවේද ගැළපෙන පරිදි පවත්වාගෙන යාමට වගබලාගනු පිණිස අප පාසල් අධ්‍යයන කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් අධ්‍යාපන විද්‍යා පුහුණුවීම් ලබති. අපගේ පුහුණු පාඨමාලා යාවත්කාලීනව මෙන්ම විශ්ව ප්‍රමිතීන්ට සමගාමීව පවත්වනු පිණිස අපගේ විෂයමාලා වරින් වර සමාලෝචනය කරනු ලැබේ.

අඩු වරප්‍රසාදලාභී තරුණ තරුණියන් සඳහා වැඩි වැටුප් ලබන රැකියා සැපයීම සම්බන්ධයෙන් වන රජයේ දැක්මට අනුකූල වන පරිදි අප විසින් අපගේ තුන් අවුරුදු සහ සිව් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවන්ට සමගාමීව නව ශිල්පීය මට්ටමේ පාඨමාලා හඳුන්වා දී ඇත. අපගේ ශිල්පීය සහ සහතිකපත් මට්ටමේ පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් පිළිගැනීම අප විසින් මේවන විට ලබාගෙන ඇති අතර මෙම පිළිගැනීම අපගේ කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවට ලබා ගැනීම සඳහා මේවන විට කටයුතු කරමින් සිටින්නෙමු. දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොල තුළ මතුවෙන අවශ්‍යතාවන් ඉලක්ක කරගනිමින් පාඨමාලා අපගේ පුහුණු වැඩසටහන්වලට හඳුන්වාදීම සිදුකරමින් පවතී.

අපගේ පුහුණු වැඩසටහන් වර්තමාන කර්මාන්ත අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස් කිරීම පිණිස කාර්මික වෘත්තිකයන් හා එක්ව අවශ්‍යතා තක්සේරුකිරීමේ වැඩසටහනක් අපි පවත්වාගෙන යන්නෙමු. ප්‍රධාන ක්ෂේත්‍රයන්හි විශේෂඥ පුහුණු ලබා දීම පිණිස බ්‍රිටිෂ් කවුන්සිල් වැනි ආයතන සමග අපි උපායමාර්ගික සබඳතා ඇතිකරගෙන සිටින්නෙමු.

සමුද්‍රා හෝටලය අප පාසැලේ අධීක්ෂණය යටතේ මුළුමනින්ම ශිෂ්‍යයන් විසින් මෙහෙයවනු ලබන අංග සම්පූර්ණ පුහුණු හෝටලයක් බවට පරිවර්තනය කිරීම සඳහා ද වර්තමානයේ කටයුතු කරමින් සිටී. ප්‍රේස්ට්, බේකරි පිළිබඳ මෙන්ම ලොන්ඩරි කටයුතු පිළිබඳ පාඨමාලා ද අප විසින් හඳුන්වා දී ඇත. තවද වානිජ ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යාම පිණිස ලොන්ඩරියක් සහ ප්‍රේස්ට් අලෙවි හලක් කොළඹ පිහිටි ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතන පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට අපි අපේක්ෂා කරමු. ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය සංචාරක කටයුතු සහ ආගන්තුක සත්කාර සම්බන්ධයෙන් ප්‍රමුඛතම ජාතික පුහුණු ආයතනය වශයෙන් මහඟු පියවරක් තැබීම සඳහා මෙම ප්‍රයත්නයන් ඉවහල්වනු ඇතැයි යන්න අපගේ බලාපොරොත්තුවයි.

සේනක විජේවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්/ප්‍ර.වි.නි.
ශ්‍රී ලංකා සංචාරක හා කළමනාකරණ ආයතනය

# හැඳින්වීම

-------------

2016 වර්ෂය වන විට සංචාරකයින් මිලියන 2.5 ක් පමණ පැමිනෙනු ඇතැයි යන්න ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ ආපේක්ෂාවයි.සංචාරකයින්ගේ පැමිණීමේ සුවිශාල වර්ධනය හේතුවෙන් කර්මාන්තය තුළ සේවය කිරීම සඳහා 600,000 ක පමණ ඇස්තමේන්තුගත කාර්යබලකායක් අවශ්‍ය වනු ඇත. පවත්නා යාන්ත්‍රණය තුළ වාර්ෂිකව 1500 ක පමණ පුහුණු පිරිසක් පමණක් බිහිකරන හෙයින් අනිවාර්යය මිනිස්බල හිගයක් ඇතිවන බව පෙනේ.

ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය රටේ ජාතික සංචාරක පුහුණු ආයතනය වශයෙන් ආගන්තුක සත්කාර සහ සංචාරක පුහුණු ලබාදීම පිළිබඳ සුවිශේෂී දැක්මින් යුක්තව වෙළඳපොල මූලික, ගුණාත්මක භාවය සහතික කරන ලද හෝටල් සහ සංචාරක පුහුණු නිමැවුම් මාලාවක් පුළුල් ඉලක්කගත කණ්ඩායමකට පිරිණැමීම  හරහා එකී හිගය පියවීම සඳහා කටයුතු කිරීමට මහත් උනන්දුවෙන් පසුවේ.

කොළඹ ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය  ප්‍රමිතියෙන් යුත් කාමර 12 කින් සහ හෝටල් කාමර පේලියකින් සමන්විත අවශ්‍යතාවයට අනුකූලව ඉදිකරන ලද හෝටල් පාසැලක පිහිටා ඇත. පොදු අවන්හල සහ බීම හල වූ කලී අංක 78, ගාලුපාර කොළඹ 03 යන ස්ථානයේ පිහිටි " හෝටල් සමුද්‍රා" යන නමින් යුත් පුහුණු හෝටලයට එකතු කරන ලද අංගයන් ය. මෙය වූ කලී පෙර "Saffton" හෝටලය පිහිටි පරිශ්‍රමය වේ.

කොළඹ ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතයේ තාහීර් ශ්‍රවණාගාරය තුළ නගරයේ සමුළු සහ ව්‍යාපාරික රැස්වීම් පැවැත්වීමට පහසුකම් සපයනු ලබයි. වායු සමනයකරන  ශ්‍රවනාගාරය 250 ක පමණ පිරිසකට අසුන්ගත හැකි අනුක්‍රමික ආසන පන්තියකින් යුක්ත වන අතර විශාල වේදිකාව, අනර්ග ධ්වනි, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණවලින් සමන්විත නෘත්‍යාගාරයක ආකාරයේ පහසුකම් සපයනු ලබයි.

සංචාරක පුහුණු කටයුතු පළාත් මට්ටමට රැගෙන යාම පිණිස මහනුවර, අනුරාධපුරය, කොග්ගල, බණ්ඩාරවෙල සහ රත්නපුර යන ප්‍රදේශවල පළාත් පාසැල් පිහිටුවන ලදී.

කොළඹ ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය නවීනතා පහසුකම්වලින් සමන්විත ප්‍රායෝගික මුළුතැන්ගෙවල් දෙකකින් සමන්විත වේ. නවීන උපකරණවලින් සමන්විත පුහුණු ආපනශාලා දෙකක් සහ විවෘත බීම හලකින් යුත් පොදු අවන්හලක් ප්‍රායෝගික සැසි පැවැත්වීම සඳහා ස්ථාපිත කොට තිබේ.

ශිෂ්‍යාන්ට ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම සහ කුසලතාවර්ධනය කර ගැනීම සඳහා පරිගණක විද්‍යාගාරයට ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දී තිබේ. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාර පුස්තකාලය ද ශ්‍රී.ලං.සං. හා හෝ.ක. ආයතනය සතුව පවතී.

# අපගේ දැක්ම

-----------------

“ ආසියාවේ සංචාරක ව්‍යාපාර හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා විශිෂ්ට පුහුණුවීම් සහ අධ්‍යාපනය ලබාදීමේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම“

# අපගේ මෙහෙවර

---------------------

- කර්මාන්තය සඳහා උසස් තත්වයෙන් යුත් සංචාරක වෘත්තිකයන් බිහිකිරීම පිණිස චාරිකා, සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර කළමනාකරණ පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් හඳුනා ගැනීම, සැලසුම් කිරීම සහ ලබාදීම.

- කර්මාන්තයේ ගතික ප්‍රවනතාවය පිළබඳ අවධානය යොමුකරමින් සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර කර්මාන්තයේ ඉල්ලුම සපුරාලීම පිණිස අවශ්‍ය මිනිස්බල පුහුණුව ලබා දීම.

- ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාරය සහ එහි අගයන් විශ්ව මට්ටමින් ප්‍රවර්ධනය කරන අතර තුර ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතින්ට සමානව සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාරය පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම.

- සංචාරක ව්‍යාපාර හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ තිරසාර වර්ධනයක් පවත්වාගෙන යන අතරතුරැම රටේ විවිධ පළාත්වල ජීවත්වන සියලුම තරුණ තරුණියන්ට සමාන අවස්ථා ලබාදීම සහ සමාන කාර්ය පරිසරයක් නිර්මාණය කිරීම.

- අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනය සැලසෙන පරිදි දේශීය සහ ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමඟ සම්බන්ධතාවය ගොඩනගා ගනිමින් සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාරය පිළිබඳ අධ්‍යාපනය ලබාදීමේ සබ්‍යතාවය ඉහළ නැංවීම.

- සංචාරක ව්‍යාපාරය සහ ආගන්තුක සත්කාරය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම මගින් විශිෂ්ටත්වය ප්‍රදර්ශනය කිරීම.

# අපගේ ඉලක්ක

------------------

- 2016 වර්ෂය වන විට චාරිකා, සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය මිනිස්බල අවශ්‍යතා සපුරාලනුවස් ශ්‍රී ලාංකිකයන් 600,000 ක පමණ පුහුණු කිරීම.

- ජාතිකත්ව හා ජාත්‍යන්තරව ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ හෝටල් කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවානියුක්ත කිරීම පිණිස මනා පරිපූර්ණ, උසස් තත්වයෙන් යුත් ශිෂ්‍යයින් බිහිකිරීම.

- සංචාරක ව්‍යාපාර සහ සත්කාර කර්මාන්තයේ හෝටල් මෙහෙයුම් කුසලතා, කළමනාකරණ ක්‍රම පිළිබඳව අවධානය යොමුකරමින් මෙන්ම වෙනස්වන විශ්ව ව්‍යාපාර පරිසරයක් තුළ අඛණ්ඩව අධ්‍යනය සිදුකිරීම සඳහා අවශ්‍ය නිපුණතා පිළිබඳ අවධානය යොමු කරමින් වැඩසටහන් සහ අදාළ පාඨමාලා සකස් කිරීම.

- දේශිය සහ ලෝක සංචාරක කර්මාන්තයේ පවතින මානව සම්පත් අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කරමින් නව සංචාරක ව්‍යාපාර අධ්‍යාපන වැඩසටහන් සකස් කිරීම.

- ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඉහළින්ම පිළිගනු ලබන හා සලකනු ලබන සුදුසුකම්වලින් සමන්විත මනා කැපවීමෙන් යුත් වෘත්තිකයන් බිහි කිරීම.

- සුවිශේෂී අධ්‍යාපනික පරිචයන් ශිෂ්‍යයින්ට ලබාදීම සහ දීර්ගකාලීනව අධ්‍යාපනික විශිෂ්ටතා අත්පත් කර ගැනීම පිණිස දිරිගැන්වීම.

- ඉදිරි තෙවසර තුළ දී ලෝක සංචාරක ව්‍යාපාර සංවිධාන ප්‍රමිත ලබාගැනීම.

- වර්ෂ දෙකක කාලයක් තුළ දී දේශීය හා ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ ජාලයක් තුළ උපාය මාර්ගික සංධාන, වරණයන් සහ පිළිගැනීම් හරහා පුළුල් ව්‍යාප්තියක් සහ නියෝජනයක් ලබා ගැනීම.

- වර්ෂයක් තුළ කාර්යමණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සහ සඛ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සලසාලනු වස් කැපවීමෙන් කටයුතු කරන මානව සම්පත් සංවර්ධන ඒකකයක් ඇතිකිරීම.

- විෂයමාලා සංවර්ධනය සහ පුහුණු ක්‍රමවේදයන් වරින් වර ප්‍රතිශෝධනය කිරීම මගින් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි ශ්‍රී. ලං. සං. හා ක. ආයතනයේ වර්තමාන සංචාරක ව්‍යාපාරය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් වැඩිදියුණු කිරීම.

- ඉදිරි තෙවසර තුළ දී ශ්‍රී ලංකාවේ සියලුම සංචාරක ව්‍යාපාර පහසුකම් සම්බන්ධයෙන් ප්‍රමිතීන් සහ අධීක්ෂණ කාර්ය රාමුවක් සකස් කිරීම මගින් 2005 ජාතික සංචාරක ව්‍යාපාර පනත මගින් දක්වන ලද ජාතික ජාතික සංචාරක ව්‍යාපාර අධ්‍යාපන ප්‍රතිපත්ති ඉල්ලීම් පිළිබඳ අවධානය යොමු කිරීම.

## අපගේ තේමාව

-----------------

*“ ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළම තලයට රැගෙන යාම - ශ්‍රී ලාංකීය ආගන්තුක සත්කාර සේවයේ විශිෂ්ටත්වය කරා පිය නගන චාරිකාවක්“*

## අපගේ හරයන්

-------------------

- **ගුණාත්මක බව** - අපගේ ශිෂ්‍යයින්ට පළමු පන්තියේ පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් අපි ලබා දෙන්නෙමු.

- **සමානාත්මතාව** - ඉහළ ජයග්‍රහනයක් සහ වර්ධනයක් සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සපුරාලීම සඳහා ජාති, ආගම්, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආර්ථික තත්ත්වය නොසලකා සෑම ශිෂ්‍යයකුටම සාමාන අවස්ථා අපි ලබා දෙන්නෙමු.

- **විශ්වසනීත්වය** - සංචාරක ව්‍යාපාරයේ සහ ආගන්තුක සත්කාර සේවාවේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා වෘත්තිය අචාරධර්ම සහ ශික්ෂණයත් ඉහළ තත්ත්වයකින්යුතුව පවත්වාගෙන යාමට අපි යත්න දරන්නෙමු.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ යෝජිත සංවිධාන ව්‍යුහය.



## 2012 වර්ෂයේදී පවත්වන ලද මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව

---------------------------------------------------------------

| මණ්ඩල රැස්වීම් අංකය | දිනය |
| --- | --- |
| 38 | 2012 ජනවාරි 26 වැනි බ්‍රහස්පතින්දා |
| 39 | 2012 මාර්තු 1 වැනි බ්‍රහස්පතින්දා |
| 40 | 2012 මාර්තු 28 වැනි බදාදා |
| 41 | 2012 මැයි 11 වැනි සිකුරාදා |
| 42 | 2012 අගෝස්තු බ්‍රහස්පතින්දා |
| 43 | 2012 සැප්තැම්බර් 7 වැනි සිකුරාදා |
| 44 | 2012 ඔක්තෝබර් 16 වැනි අඟහරුවාදා |
| 45 | 2012 නොවැම්බර්19 වැනි සඳුදා |

## 2012 වර්ෂයේදී පවත්වන ලද විගණන හා කළමනාකරණ රැස්වීම් සංඛ්‍යාව

------------------------------------------------------------------------------

| රැස්වීම් අංකය | දිනය |
| --- | --- |
| 01 | 2012දෙසැම්බර් 30 වරනි සිකුරාදා |
| කල්දමන ලද 01 වැනි රැස්වීම | 201 ජනවාරි 18 වැනි බදාදා |
| 02 | 2012 පෙබරවාරි 28 වැනි බදාදා |
| 03 | 2012 මාර්තු 30 වැනි සිකුරාදා |
| 04 | 2012 මැයි 11 වැනි සිකුරාදා |
| 05 | 2012 ජූනි 5 වැනි අඟහරුවාදා |
| 06 | 2012 අගෝස්තු 16 වැනි බ්‍රහස්පතින්දා |
| 07 | 2012 ඔක්තෝබර් 24 වැනි බදාදා |

## ශ්‍රී. ලං. සං. හා. හෝ. ක. ආයතනය - කොළඹ.

ශිෂ්‍යයන් සඳහා පවත්වන ලද විෂය බාහිර ක්‍රියාකාරකම්.







## පවත්වන ලද දෛනික වැඩසටහන් පිළිබඳ විස්තර.

| වැඩසටහන | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම |
| ශිල්පීය පාඨමාලාව - ගෘහ පාලනය | 47 | 27 | 32 | 25 |
| ශිල්පීය පාඨමාලාව - ආහාර හා පාන | 44 | 34 | 45 | 37 |
| ශිල්පීය පාඨමාලාව - සූප ශාස්ත්‍රය | 60 | 49 | 59 | 44 |
| **ශිල්ප පාඨමාලා - මුළු ගණන** | 151 | 110 | 136 | 106 |
| සහතික පත්‍ර පාඨමාලාව - ගෘහ පාලනය | 68 | 61 | 82 | 75 |
| සහතික පත්‍ර පාඨමාලාව - ආහාර හා පාන | 111 | 109 | 101 | 98 |
| සහතික පත්‍ර පාඨමාලාව - සූප ශාස්ත්‍රය | 91 | 87 | 78 | 76 |
| සහතික පත්‍ර පාඨමාලාව - ඉදිරිපස කාර්යාලය | 59 | 50 | 71 | 61 |
| **සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන** | 329 | 307 | 332 | 310 |
| අන්තර් මධ්‍ය පාඨමාලාව - ගෘහ පාලනය | - | - | 8 | 8 |
| අන්තර් මධ්‍ය පාඨමාලාව - ආහාර හා පාන | 15 | 14 | 19 | 19 |
| අන්තර් මධ්‍ය පාඨමාලාව - සූප ශාස්ත්‍රය | 17 | 16 | 24 | 24 |
| අන්තර් මධ්‍ය පාඨමාලාව - ඉදිරිපස කාර්යාලය | - | - | 21 | 19 |
| **අන්තර් මධ්‍ය පාඨමාලා - මුළු ගණන** | 32 | 30 | 72 | 70 |
| උසස් පාඨමාලාව - උපකාරක මෙහෙයුම් | - | - | 24 | 23 |
| උසස් පාඨමාලාව -ආහාර හා පාන | 14 | 14 | 19 | 19 |
| උසස් පාඨමාලාව - සූප ශාස්ත්‍රය | 16 | 16 | 23 | 22 |
| **උසස් පාඨමාලා - මුළු ගණන** | 30 | 30 | 66 | 64 |
| ජාතික සංචාරක නියමුවා | | | 192 | 144 |
| රියදුරු සංචාරක නියමුවා | 223 | 166 | - | - |
| ප්‍රාදේශීය සංචාරක නියමුවා | | | 70 | 68 |
| **සංචාරක නියමු පුහුණු මුළු ගණන** | 223 | 166 | 262 | 212 |

# ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය මගින් හෝටල් කර්මාන්තයට හඳුන්වාදෙනු ලැබූ නවකයින් සංඛ්‍යාව - 2012 වර්ෂය

| සිසුන් ඇතුළත් කර ගැනීම | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ශිල්ප පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා | ශිල්ප පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 157 | 353 | 106 | 338 |
| නැවත ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | - | 174 | - | 119 |
| නවක ශිෂ්‍ය සංඛයාව | 157 | 179 | 106 | 219 |

## සංචාරක ව්‍යාපාරයේ සහ ආගන්තුක සත්කාරක සේවාවේ යහපත උදෙසා පවත්වන ලද වැඩසටහන් 2012 වර්ෂය

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | සංවිධානය | කාලසීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කාර්යාල සහයකයින් සඳහා ආහාර හා පාන පිළිබඳ වැඩසටහන | සමූපාකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යංශය | පෙබරවාරි 25 | 19 |
| 2 | බංගලා පාලකවරුන් සඳහා පුහුණුව | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | මාර්තු - 20,21 සහ 22 | 20 |
| 3 | කාර්යාල සහයකයින් සඳහා ආහාර හා පාන පිළිබඳ වැඩසටහන | විදේශ රැකියා සහ සුබසාධන අමාත්‍යංශය | ජූලි 21 | 10 |
| 4 | කාර්යාල සහයකයින් සඳහා ආහාර හා පාන පිළිබඳ වැඩසටහන | කර්මාන්ත හා වානිජ අමාත්‍යංශය | මැයි 12 | 10 |
| 5 | බංගලා පාලකවරුන් සඳහා පුහුණුව- ආහාර පාන, ගෘහ පාලනය, සූප ශාස්ත්‍රය | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | ජූලි 29 | 08 |

| | | | | |
|---|---|---|---|---|
| 6 | කාර්යාල සහයකයින් සඳහා ආහාර හා පාන පිළිබඳ වැඩසටහන | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | සැප්තැම්බර් 2 | 17 |
| 7 | ගෘහ පාලනය හා ඉදිරිපස කාර්යාල මෙහෙයුම් | කීල්ස් හෝටල් සමූහ ව්‍යාපාරය | | |
| 8 | බංගලා පාලකවරුන් සඳහා පුහුණුව- ආහාර පාන, ගෘහ පාලනය, සූප ශාස්ත්‍රය | ජාතික ගොඩනැගිලි සංවර්ධන අධිකාරිය | 2012 නොවැම්බර් 24/ 25 | 20 |
| 9 | සංචාරක භාෂණ පරිවර්තකයින් සඳහා පුහුණු වැඩසටහන | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | | 200 graduates |

# 2012 වර්ෂයේදී සිදු කරන ලද විෂය භාහිර ක්‍රියාකාරකම්.

- වෙසක් පහන් කූඩු තරගය
- අන්තර් පංති ක්‍රිකට් තරඟාවලිය
- ඩෙංගු නිවාරණ වැඩසටහන
- බාර්ටෙන්ඩර් තරඟය

## ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කලමනාකරන ආයතනය විසින් පිරිනමන ලද වැඩසටහන් සඳහා පැවති ඉල්ලුම.

| වැඩසටහන | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | | 55 | 45 | | 44 | 26 |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | | 48 | 43 | | 50 | 38 |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | | 186 | 69 | | 142 | 42 |
| **ශිල්ප පාඨමාලා - මුළු ගණන** | | 289 | 157 | | 236 | 106 |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | | 85 | 83 | | 92 | 87 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | | 124 | 114 | | 166 | 101 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | | 380 | 95 | | 279 | 80 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | | 90 | 61 | | 125 | 70 |
| **සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන** | | 679 | 353 | | 662 | 338 |
| අන්තර් මධ්‍ය පාඨමාලා - ගෘහ පාලනය | | 7 | - | | 9 | 9 |
| අන්තර් මධ්‍ය පාඨමාලා - ආහාර හා පාන | | 23 | 14 | | 28 | 19 |
| අන්තර් මධ්‍ය පාඨමාලා - සූප ශාස්ත්‍රය | | 25 | 16 | | 29 | 24 |
| අන්තර් මධ්‍ය පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | | 15 | - | | 32 | 21 |
| **අන්තර් මධ්‍යම පාඨමාලා - මුළු ගණන** | | 70 | 30 | | 117 | 73 |
| උසස් පාඨමාලා - | - | - | - | - | - | 30 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උපකරණ මෙහෙයුම් | | | | | | |
| උසස් පාඨමාලා -ආහාර හා පාන | | - | 14 | | - | 19 |
| උසස් පාඨමාලා - සූප ශාස්ත්‍රය | | - | 16 | | - | 24 |
| **උසස් පාඨමාලා - මුළු ගණන** | | - | 30 | | - | 73 |
| ජාතික සංචාරක නියමුවා | - | - | - | - | - | - |
| රියදුරු සංචාරක නියමුවා | 516 | 360 | 218 | 372 | 279 | 192 |
| ප්‍රාදේශීය සංචාරක නියමුවා | - | - | - | - | - | - |
| සංචාරක නියමු පුහුණු මුළු ගණන | | | | | | |

## 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රමෝපායන්

---------------------------------------------------------------------------

- ❖ විද්‍යාලයේ සාමාජිකයින් 29 දෙනෙක් රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද පස් දින ජාතික වෘත්තීය සුදුසුකම් තක්සේරුකරු පුහුණු වැඩසටහන සාර්තක ලෙස සම්පූර්ණ කළහ.

- ❖ සංචාරක ව්‍යාපාර සම්පත්සංවර්ධන ව්‍යාපෘතියේ ආධාර ඇතිව විෂය ක්ෂේත්‍ර 12 කට අදාළ විෂයමාලා සංවර්ධන කටයුතු සම්පූර්ණ කරන ලදී.

- ❖ ශ්‍රී. ලං. සං. හා. හෝ. ක. ආයතනයේ පුහුණු සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා නව විස්තර පත්‍රිකා සකස් කරන ලදී.

- ❖ වෘත්තීය මාර්ගෝපදේශන සහ විෂයමාලා සංවර්ධන ඒකකයක් ස්ථාපිත කරන ලදී.

- ❖ බේකරි සහ ලොන්ඩරි සංශෝධිත මෙහෙයුම්

## 2013 වර්ෂයේ සංවර්ධන ක්‍රමෝපා පිළිබඳ සාරාංශයක්

---------------------------------------------------------------

- ❖ සහතික පත්‍ර මට්ටමේ පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම දෙගුණ කිරීම.
- ❖ ඵලදායිතාවය වර්ධනය කිරීම පිණිස අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පුහුණු ලබාදීම.
- ❖ විෂය භාහිර ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයින්ගේ සහභාගීත්වය ඉහළ නැංවීම.

කොළඹ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය.



## ශ්‍රී. ලං. සං. හා. හෝ. ක. ආයතනය - අනුරාධපුරය.
## ශිෂ්‍යයන් සඳහා පවත්වන ලද විෂය හාහිර ක්‍රියාකාරකම්.





අන්තර් පංති ක්‍රිකට් තරඟාවලිය.

- පාසැල් ගොඩනැගිල්ල විදුලි ආලෝකමත් කිරීම සහ වෙසක් පහන් දැල්වීම.
- වෙසක් උත්සවය සමරා අයිස්ක්‍රීම් දන්සැලක් පැවැත්වීම.
- අන්තර් පංති ක්‍රිකට් තරඟාවලිය .
- ලෝක සංචාරක ව්‍යාපාර දිනය සමරනුවස් අභයගිරියේදී ශ්‍රමදාන ව්‍යාපාරයක් සංවිධානය කිරීම.

පවත්වන ලද දෛනික වැඩසටහන් පිළිබඳ විස්තර.

| වැඩසටහන | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | - | - | 32 | 32 |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | 39 | 36 | - | - |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | 16 | 09 | 14 | 13 |
| **ශිල්ප පාඨමාලා - මුළු ගණන** | 55 | 45 | 46 | 45 |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | - | - | - | - |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 08 | 06 | 23 | 23 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | 21 | 19 | 55 | 51 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 09 | 06 | - | - |
| **සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන** | 38 - | 31 - | 76 02 | 72 02 |

අනුරාධපුරයේ ශ්‍රී. ලං. සං. හා. හෝ. ක. ආයතනය මගින් හෝටල් ක්ෂේත්‍රයට හඳුන්වාදෙනු ලැබූ නවකයින් - 2012 වර්ෂය.

| සිසුන් ඇතුළත් කර ගැනීම | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ශිල්පී පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා | ශිල්පී පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 55 | 38 | 46 | 78 |
| නැවත ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | - | 05 | - | 22 |
| නවක ශිෂ්‍ය සංඛයාව | 55 | 33 | 46 | 56 |

සංචාරක ව්‍යාපාරයේ සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ යහපත උදෙසා පවත්වන ලද වැඩසටහන්.

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | සංවිධානය | කාලසීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | දැනුවත් කිරීමේ වැඩසටහන | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය<br>පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>පළාත් සමෘද්ධි කාර්යාලය | දින 01<br>දින 01<br>දින 01 | 150<br>28<br>75 |
| 02 | පාසැල් දැනුවත් කිරීම | අ/ කලත්තෑව විද්‍යාලය<br>අ/ මහ බුලන්කුලම විද්‍යාලය<br>අ/ තඹුත්තේගම මධ්‍ය මහා විද්‍යාලය<br>වෘත්තීය පුහුණු අධිකාරිය<br>අ/ කැබිතිගොල්ලෑව මධ්‍ය මහා විද්‍යාලය<br>අ/ විද්‍යාදර්ශී මහා විද්‍යාලය<br>අ/ මිහින්තලෙ මහා විද්‍යාලය<br>අ/ කහටගස් දිගිලිය මහා විද්‍යාලය | දින 01<br>දින 01<br>දින 01<br>දින 01<br>දින 01<br>දින 01<br>දින 01<br>දින 01 | 12<br>09<br>350<br>60<br>300<br>200<br>250<br>40 |
| 03 | අනුරාධපුර ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනයේ ශිෂ්‍යයින් සඳහා දේශනයක් සමග මුළුතැන්ගෙයි කටයුතු පිළිබඳ ප්‍රදර්ශනාත්මක වැඩසටහනක් ඉදිරිපත් කිරීම. | හබරණ සිනමන් ලොඩ්ජ් හෝටලයේ ජ්‍යෙෂ්ට ප්‍රධාන සූපවේදියා විසින් පවත්වන ලදී. | - | - |
| 04 | දැනුවත් කිරීමේ වැඩසටහන | අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය | දින 01 | 60 |
| 05 | ආගන්තුක සත්කාර ක්ෂේත්‍රෙය් ප්‍රයෝජන - ජාතික තරුණ බලකාය, පලාඩිකුලම අනුරාධපුරය. | අනුරාධපුර ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර හා හෝටල් කළමනාකරණ ආයතනය | දින 03 | ගුරුවරුන් 12<br>ශිෂ්‍යයින් 48 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | හෝටල් කර්මාන්තය සඳහා EKSP ප්‍රයෝජනවත් වන්නේ කෙසේද? :- අනුරාධපුර පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>❖ ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ | අනුරාධපුර ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර හා හෝටල් කළමනාකරණ ආයතනය. පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - අනුරාධපුරය. | දින 01 | කාර්යමණ්ඩල සාමාජිකයින් 04 |
| | ❖ දැනුවත් කිරීම/ දිවා ආහාර (ප්‍රායෝගික ආපනශාලා සේවය) | | දින 01 | කාර්යමණ්ඩල සාමාජිකයින් 10 |
| | ❖ දැනුවත් කිරීම/ දිවා ආහාර (ප්‍රායෝගික ආපනශාලා සේවය) | අතිරේක දිස්ත්‍රික් ලේකම්, සමෘද්ධි නියෝජ්‍ය කොමසාරිස් අනුරාධපුරය. | දින 01 | කාර්යමණ්ඩල සාමාජිකයින් 03 |
| 07 | හෝටල් කර්මාන්තයට හඳුන්වාදීමක් රජයට විශ්ව විද්‍යාලය, මිහින්තලය | ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර හා හෝටල් කළමනාකරණ ආයතනය - අනුරාධපුරය. | දින 03 | ශිෂ්‍යයින් 54 |
| | ආහාර මේසයකදී හැසිරෙන පිළිවෙළ සහ අචාරධර්ම වැඩසටහන රජරට විශ්ව විද්‍යාලය - මිහින්තලය | ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර හා හෝටල් කළමනාකරණ ආයතනය - අනුරාධපුරය. | දින 04 | ශිෂ්‍යයින් 58 |

## අධ්‍යන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පුහුණු ලබාදීම - 2012 වර්ෂය

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය. 1 | පුහුණුව ලබාදීම | කාලය | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මිලදී ගැනීම් කළමනාකරණය | මිලදී ගැනීම සහ ගබඩා පාලනය | මාස 03 යි. | 01 |

## 2013 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රමෝපා පිළිබඳ සාරාංශයක්

1. 1. “සිරිලිය“ ගෘහනියන්ගේ සංගමය සඳහා සැන්ඩ්විච්, පේස්ට් සහ ෂෝර්ට් ඊට්ස්, බේකරි අයිතම, විවධ ජනවාර්ගික කෑම වර්ග, මිශ්‍ර බීම (ඇල්කොහොල් අඩංගු නොවන) පිළියෙල කිරීම පිළිබඳ ප්‍රදර්ශනාත්මක වැඩසටහනක් පැවැත්වීම.

2. පළාතේ හෝටල්, තානායම්, අවන්හල් සහ නිවාඩු නිකේතනවල කාර්ය මණ්ඩලය සඳහා ඉල්ලුම මත පුහුණු වැඩසටහන් පැවැත්වීම.

3. ගෘහවිද්‍යා ගුරුවරුන් සහ ශිෂ්‍යයින් සඳහා දැනුවත් කිරීමේ සැසි පැවැත්වීම හා ආයතික කටයුතු පිළිබඳ දැනුවත්බවක් ලබාදීම.

4. ආහාර මේසයකදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් සහ ආචාරධර්ම පිළිබඳ වැඩසටහන් පැවැත්වීම.

අනුරාධපුර ශ්‍රී ලංකා සංචාරක සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය.

SRI LANKA INSTITUTE OF TOURISM & HOTEL MANAGEMENT
ANURADHAPURA PROVINCIAL COLLEGE




Seated from left - Mr. W.M.S.P.Weerakoon – Assistant Lecturer (Front Office Operations),Mr. C.Lasitha De Silva – Assistant Lecturer (Food & Beverage Operations), Mr. G.L.B.Ramesh Perera – Senior Lecturer-in-Charge, Mr. M.B.J.M.I.B.Jayasekara – Assistant Lecturer (Accommodation Operations),Mr. M.Gunaratne - Assistant Lecturer (Professional Cookery),Mr. N.P.M.Randeniya - Junior Instructor (Professional Cookery)

## ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය - බණ්ඩාරවෙල

## ශිෂ්‍යයන් සඳහා පවත්වන ලද විෂය භාහිර ක්‍රියාකාරකම්

- මත්ද්‍රව්‍ය පිළබඳ දැනුවත් කිරීමේ වැඩසටහන



- **ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**



- ශ්‍රමදාන ව්‍යාපාරය



- අන්තර් පසැල් ක්‍රිකට් තරඟාවලිය
- අලුත් අවුරුදු උත්සවය

ආගන්තුක සත්කාර කළමනාකරණ ප්‍රදර්ශනය (ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලදී)



- ප්‍රථමාධාර වැඩසටහන

  සහ

  කැරම් තරඟාවලිය





- දෙමව්පිය රැස්වීම්





- අන්තර් පාසැල් ක්‍රිකට් තරඟාවලිය

ප්‍රජා ආධාර වැඩසටහන





ශිෂ්‍ය සුහද හමුව



## පවත්වන ලද දෛනික වැඩසටහන් පිළිබඳ විස්තර.

| වැඩසටහන | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | 20 | 19 | 13<br>- | 12 |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | - | - | - | - |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | - | - | - | - |
| **ශිල්ප පාඨමාලා - මුළු ගණන** | 20 | 19 | 13 | 12 |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | 35 | 25 | 38 | 18 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 38 | 29 | 39 | 18 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | 50 | 42 | 48 | 24 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 32 | 24 | 29 | 11 |
| **සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන** | 154 | 120 | 154 | 71 |

### බණ්ඩාරවෙල ශ්‍රී. ලං. සං. හා. හෝ. ක. ආයතනය මගින් හෝටල් කර්මාන්තයට හඳුන්වාදෙනු ලැබූ නවකයින් - 2012 වර්ෂය.

| සිසුන් ඇතුළත් කර ගැනීම | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ශිල්ප පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා | ශිල්ප පාඨමාලා | සහතික පත්‍ර පාඨමාලා |
| සිසුන් ඇතුළත් කර ගැනීම | 19 | 154 | 12 | 154 |
| සිසුන් ඇතුළත් කර ගැනීම | - | 30 | - | 30 |
| සිසුන් ඇතුළත් කර ගැනීම | 19 | 124 | 12 | 124 |

### සංචාරක ව්‍යාපාරයේ සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ යහපත උදෙසා පවත්වන ලද වැඩසටහන් – 2012 වර්ෂය.

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | සංවිධානය | කාලසීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | හෝටල් පාසල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ මීගහකිවුල ජාතික පාසල | දින 01 | 23 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | බංගලා පාලකවරුන් සඳහා පුහුණු වැඩසටහන | ප්‍රධාන අමාත්‍ය නිවසේ බංගලා පාලකයින් | දින 03 | 37 |
| 3 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ සිටින රැකියා අපේක්ෂකයින් | දින 01 | 32 |
| 4 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ බදුල්ල හින්දු කාන්තා උසස් විද්‍යාලය | දින 01 | 15 |
| 5 | ආහාර පාන සහ ගෘහ පාලනසේවා පිළිබඳ පුහුණු වැඩසටහන් ක්‍රමවේද | ප්‍රදාන අමාත්‍යතුමාගේ රැස්වීම්වලදී සේවා සපයනු ලබන කාර්ය මණ්ඩලයේ තෝරාගත් සාමාජිකයින් | දින 01 | 15 |
| 6 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය | දින 01 | 25 |
| 7 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | මො/ මොනරාගල රාජකීය විදයාලය | දින 01 | 15 |
| 8 | ව්‍යාපාර ආචාරධර්ම පද්ධති, ආහාර මේසයේදී පිළිපැදිය යුතු ක්‍රියා පිළිවෙත් සහ පුද්ගලික සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ පුහුණුව | සබරගමුව විශ්වවිද්‍යාලය | දින 01 | 6 |
| 9 | සූප ශාස්ත්‍ර පිළිබඳ පාඨමාලාව | ඌව පලාත් සුදුසුකම් නොලත් තරුණ තරුණියන් | දින 01 | 25 |
| 10 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ශ්‍රී චන්ද්‍රජෝති විද්‍යාලය - යක්කල | දින 01 | 28 |
| 11 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | අම්/ උස්කිරිපුර විදයාලය - අම්පාර | දින 01 | 27 |
| 12 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ උඩවෙල මධ්‍ය මහා විද්‍යාලය බදුල්ල | දින 01 | 25 |
| 13 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | නැනසල බලංගොඩ | දින 01 | 21 |
| 14 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ උදයරාජ මහා විද්‍යාලය බදුල්ල | දින 01 | 27 |
| 15 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ කැන්දකැපුඋලපොත මහා විද්‍යාලය බදුල්ල | දින 01 | 23 |

| | | | | |
|---|---|---|---|---|
| 16 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | අම්පාර දිස්ත්‍රික්කයේ ගෘහවිද්‍යා ගුරුවරුන් | දින 01 | 26 |
| 17 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | අම්පාර දිස්ත්‍රික්කයේ ගෘහවිද්‍යා ගුරුවරුන් | දින 01 | 25 |
| 18 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ ධර්මාශෝක මහා විද්‍යාලය බණ්ඩාරවෙල | දින 01 | 25 |
| 19 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බ/ ධර්මාශෝක මහා විද්‍යාලය බණ්ඩාරවෙල | දින 01 | 18 |
| 20 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | බණ්ඩාරවෙල තාක්ෂණ විද්‍යාලයේ ශිෂ්‍යයින් | දින 01 | 28 |
| 21 | සංචාරක නියමුවන් සඳහා පුහුණු වැඩසටහන | ඌව පලාත තුළ | දින 10 | 37 |
| 22 | හෝටල් පාසැල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් | දින 01 | 23 |
| 23 | ජාතික ඔලිම්පික් අධ්‍යයන සැසි | ජාතික ඔලිම්පික් කමිටුව විසින් | දින 04 | 60 |

## අධ්‍යයන / අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම - 2012 වර්ෂය.

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | පුහුණුව ලබාදීම | කාල සීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මානව සම්පත් කළමනාකරණය | බණ්ඩාරවෙල ජ එම්. සී.ආයතනය | මාස 06 | 01 |

## 2013 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රමෝපා පිළිබඳ සාරාංශයක්.

1. සිසුන් බඳවාගැනීම උපරිමයට ගෙන ඒම සඳහා හෝටල් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පාසැල් ශිෂ්‍යයන් සහ තරුණ මධ්‍යස්ථානවල ශිෂ්‍යන් වෙනුවෙන් පැවැත්වීම.

2. කර්මාන්තය පිළිබඳ පවතින දැනුම වර්ධනය කිරීම උදෙසා රැකියා විරහිත තරුණ තරුණියන් සහ හෝටල් සේවකයින් සඳහා කෙටි කාලීන පුහුණු පාඨමාලා වැඩි වශයෙන් පැවැත්වීම.

3. ආයතනයට අතිරේක අදායමක් උපයා ගැනීම සඳහා පාසැල් ශාලාවේ සම්මන්ත්‍රණ පැවැත්වීම සහ තත්‍ය ක්‍රියාකාරී පරිසරයක් නිර්මාණය කිරීම මගින් හෝටල් පාසැල් ශිෂ්‍යයන් සඳහා ප්‍රායෝගික පුහුණු ලබා දීම.

4. ඌව පළාත් සභාව විසින් වෙන්කරන ලද අයවැය ප්‍රතිපාදන මත ප්‍රාදේශීය චාරිකා මගපෙන්වීම් පාඨමාලා වැනි පුහුණු පාඨමාලා පැවැත්වීම පිණිස ඌව පළාත් සභාව සමග මනා සබඳතාවක් සහ සහයෝගීතාවයක් ගොඩනගා ගැනීම.

5. ආහාර මේසයේදී පිළිපැදිය යුතු ආචාරධර්ම හා ක්‍රියා පිළිවෙත් වැනි අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම පිණිස පුද්ගලික හා රාජ්‍ය ආයතන සහ සංවිධාන සමග සම්බන්ධ වී කටයුතු කිරීම.

**බණ්ඩාරවෙල ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය**



## ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය විසින් පිරිනමන ලද වැඩසටහන් සඳහා පැවති ඉල්ලුම.

| වැඩසටහන | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලන | 25 | 22 | 20 | 22 | 20 | 12 |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පා | 15 | 15 | - | 10 | 10 | - |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | 10 | 10 | - | 30 | 25 | - |
| ශිල්ප පාඨමාලා - මුළු ගණන | 50 | 40 | 20 | 62 | 55 | 12 |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | 45 | 40 | 35 | 42 | 35 | 30 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 30 | 28 | 25 | 32 | 28 | 19 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | 88 | 40 | 21 | 90 | 60 | 22 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 35 | 28 | 22 | 30 | 26 | 25 |
| සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන | | | | | | |

## ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය - මහනුවර






ශිෂ්‍යයන් සඳහා පවත්වන ලද විෂය බාහිර ක්‍රියාකාරකම්

**මහනුවර සංගරාජමාවතේ අංක 64 යන ස්ථානයේ පැවැත්වූ ගිණි නිවීමේ පුහුණු වැඩසටහන**

- අලුත් අවුරුදු උත්සවය - 2012 අප්‍රේල් 28
- වෙසක් පහන් කූඩු තරඟය - 2012 මැයි 05
- ලේ දන්දීමේ ව්‍යාපාරය - 2012 මැයි 04






බැංකු කටයුතු

ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන






මධ්‍යම පළාත් වෙළඳ හා වාණිජ හා සංචාරක ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා එක්ව ලෝක “සංචාරක ව්‍යාපාර දිනය” සැමරීම- 2012 සැප්තැම්බර් 27





- 2012 ඔක්තෝබර් 26 දින මහනුවර මහරෝහලේ පිළිකා වාට්ටුවේ පැවැත්වූ ශ්‍රමදාන ව්‍යාපාරය



ශිෂ්‍ය සුහද හමුව- 2012 නොවැම්බර් 07

## පවත්වන ලද දෛනික වැඩසටහන් පිළිබඳ විස්තර.

| වැඩසටහන | **2011** | | **2012** | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | - | - | - | - |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | - | - | - | - |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | - | - | 24 | 20 |
| ශිල්ප පාඨමාලා - මුළු ගණන | - | - | 24 | 20 |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | 46 | 35 | 63 | 58 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 72 | 69 | 63 | 57 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | 77 | 68 | 65 | 64 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 46 | 36 | 54 | 47 |
| සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන | 220 19 | 194 14 | 279 14 | 243 12 |

## මහනුවර ශ්‍රී .ලං .සං .හා .හෝ .ක .ආයතනය මගින් හෝටල් කර්මාන්තයට හඳුන්වාදෙනු ලැබූ නවකයින් -2012 වර්ෂය.

| සිසුන් ඇතුළත් කර ගැනීම | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ශිල්ප පාඨමාලා | සහතික පත්‍ර පාඨමා | ශිල්ප පාඨමාල | සහතික පත්‍ර පාඨමා |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | - | 239 | 24 | 247 |
| නැවත ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | - | 36 | - | 82 |
| නවක ශිෂ්‍ය සංඛ්‍යාව | - | 228 | - | 165 |

## සංචාරක ව්‍යාපාරයේ සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ යහපත උදෙසා පවත්වන ලද වැඩසටහන්.

| අංක | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | සංවිධානය | කාලසීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | කඩිනම් නිපුනතා සංවර්ධන වැඩසටහන | අ.පො.ස.(සා/පෙ) සුදුසුකම් නොමැති සිසුන් | මාස 03 | 26 |
| 2 | ප්‍රේස්ට් සහ බේකරි පාඨමාලාව | අ.පො.ස.(සා/පෙ) සුදුසුකම් නොමැති සිසුන් | සති 04 | 22 |
| 3 | කඩිනම් නිපුනතා සංවර්ධන වැඩසටහන | අ.පො.ස.(සා/පෙ) සුදුසුකම් නොමැති සිසුන් | සති 04 | 25 |
| 4 | නිපුනතා සංවර්ධන වැඩසටහන | උද්භිත උද්‍යානයේ බංගලා පාලක | දින 04 | 06 |
| 5 | EKSP වැඩසටහන | උසස් පෙළ සුදුසුකම් සහිත සිසුන් | මාස 01 | 28 |
| 6 | පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන | සිරිමල්වත්ත විද්‍යාලය - විතතේගම | දින 01 | 43 |
| 7 | ආහාර මේස ආචාරධර්ම සහ මල් සැකසුම | අරංගල කණිෂ්ඨ විද්‍යාලය | දින 01 | 21 |
| 8 | ආහාර මේස ආචාරධර්ම සහ පිළිවෙත් | සංඝබෝධි මධ්‍ය විද්‍යාපය - තෙල්දෙනිය | දින 01 | 15 |
| 9 | ආහාර මේස ආචාරධර්ම සහ පිළිවෙත් | අරංගල කණිෂ්ඨ විද්‍යාලය | දින 01 | 27 |
| 10 | ආහාර මේස ආචාරධර්ම සහ මල් සැකසුම | හිරිවඩුන්න මධ්‍ය දභා විද්‍යාලය | දින 01 | 30 |
| 11 | ආහාර මේස ආචාරධර්ම සහ මල් සැකසුම | මැණික්හින්න මහා විද්‍යාලය | දින 01 | 22 |
| 12 | ආහාර මේස ආචාරධර්ම සහ පිළිවෙත් | මහාමායා බාලිකා විද්‍යාලය | දින 01 දින තුනක් සඳහා වැඩසටහන | 130 |
| 13 | ආහාර මේස ආචාරධර්ම සහ මල් සැකසුම | හිල්වුඩ් විද්‍යාලය | දින 01 දින 02ක් සඳහා වැඩසටහන | 25 |
| 14 | ආහාර මේස ආචාරධර්ම සහ පිළිවෙත් | ශාන්ත අන්තෝනි කන්‍යාරාමය | දින 01 | 25 |
| 15 | ව්‍යාපාර ආචාරධර්ම හා පොදු ආචාරධර්ම | රජරට විශ්ව විද්‍යාලය | දින 02 | 15 |
| 16 | ආහාර මේස ආචාරධර්ම සහ පිළිවෙත් | වනජීවී දෙපාර්තමේන්තුව | දින 01 දින 02ක් සඳහා වැඩසටහන | 40 |

| | | | | |
|---|---|---|---|---|
| 17 | පාන් වර්ග පිළිබඳ ප්‍රදර්ශනාත්මක වැඩසටහන | මහනුවර හෝටල්කරුවන්ගේ සංගමය | දින 01 | 100 |
| 18 | ඉවුම් පිහුම් පිළිබඳ ප්‍රායෝගික පුහුණු සැසිය | රජරට විශ්ව විද්‍යාලය | දින 05 | 15 |

අධ්‍යන / අනධ්‍යන කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම - 2012 වර්ෂය

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | පුහුණුව ලබාදීම | කාල සීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | සමස්ත හෝටල් මෙහෙයුම | අහුංගල්ල හෙරිටන්ස් හෝට | දින 03 | 01 |
| | | | | |

2013 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රමෝපා පිළිබඳ සාරංශයක්.

1. ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයකනය මහනුවර කුණ්ඩසාලයේ දී නිලවශයෙන් විවෘත්ත කිරීම.
2. තුන් අවුරුදු ඩිප්ලෝමා වැඩසටහන පැවැත්වීම.
3. ගෙවතු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

**මහනුවර ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය**



## ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනයේ පිරිණමන ලද වැඩසටහන් සඳහා පැවති ඉල්ලුම.

| වැඩසටහන | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | - | - | - | - | - | - |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | - | - | - | - | - | - |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | - | - | - | 20 | 20 | 20 |
| ශිල්ප පාඨමාලා - මුළු ගණන | | | | 20 | 20 | 20 |
| සහතික පත්‍ර පාඨමාලා - පාලනය | 39 | 34 | 29 | 37 | 32 | 36 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 68 | 61 | 59 | 68 | 59 | 63 |
| සහතික පත්‍ර පාඨමාලා ශාස්ත්‍රය | 210 | 186 | 180 | 220 | 200 | 87 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 45 | 42 | 39 | 60 | 56 | 33 |
| සහතික පත්‍ර පාඨමාලා ගණන | 362 | 323 | 307 | 405 | 367 | 239 |

# ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය - කොග්ගල.

## ශිෂ්‍යයන් සඳහා පවත්වන ලද විෂය භාහිර ක්‍රියාකාරකම්.





## පවත්වන ලද දෛනික වැඩසටහන් පිළිබඳ විස්තර.

| වැඩසටහන | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | 28 | 18 | 10 | 08 |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | 35 | 24 | 13 | 11 |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | 42 | 32 | 16 | 16 |
| ශිල්ප පාඨමාලා - මුළු ගණන | | | | |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | 41 | 41 | 51 | 51 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 51 | 49 | 45 | 41 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | 60 | 56 | 62 | 56 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 53 | 54 | 69 | 71 |
| සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන | 205 | 201 | | 225 |

සංචාරක ව්‍යාපාර සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ යහපත උදෙසා පවත්වන ලද වැඩසටහන් - 2012 වර්ෂය.

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | සංවිධානය | කාල සීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ගාල්ල | EKSP | 17.12.2012 - 21.01.2013 | 37 |
| | | ජෝන් කීල්ස් | 23.05.2011 – 23.09.2011 | 70 |
| | | | | |

කොග්ගල ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය



## ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය - රත්නපුරය.

## ශිෂ්‍යයන් සඳහා පවත්වන ලද විෂය භාහිර ක්‍රියාකාරකම්.

### අලුත් අවුරුද්ද සැමරීම





### රුක් රෝපණ වැඩසටහන





### වෙසක් උත්සවය





අන්තර් පංති ක්‍රිකට් කරඟාවලිය




කැරම් තරඟාවලිය




බුද්ධ ප්‍රතිමාව නිරාවරණය කරමින් දෙවර්ෂ පූර්ණය සැමරීම






## පවත්වන ලද විශේෂ වැඩසටහන්





## ශිෂ්‍ය කාර්යසාධන ඇගයුම් (වර්ණ)





## ක්ෂය රෝගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන





## රත්නපුරය -ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් කටයුතු.

| අංකය | ක්‍රියාකාරකම | ස්ථානය | දිනය |
|---|---|---|---|
| 01 | මාර්ග ආරක්ෂණ වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.02.22 |
| 02 | නිවිතිගල තරුණ බලකාය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන | නිවිතිගල තරුණ බලකා පුහුණු මධ්‍යස්ථානය | 2012.02.29 |
| 03 | ර/ ධර්මාලෝක නවෝදයා විද්‍යාලයේ සිසුන් පැවැත්වූ වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.03.21 |
| 04 | කොක්ටේල් තරඟය | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.03.20 |
| 05 | ඇලෝසියස් විද්‍යාලයේ සිසුන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන | ඇලෝසියස් විද්‍යාලය රත්නපුරය. | 2012.03.23 |
| 06 | ප්‍රථමාධාරවැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.03.26 |
| 07 | අලුත් අවුරුදු උත්සවය | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.04.05 |
| 08 | ක්‍රිකට් තරඟාවලිය | රත්නපුර සීවලී විද්‍යාලීය ක්‍රීඩාංගනය | 2012.04.24 |
| 09 | ලේ දන් දීමේ වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.04.26 |
| 10 | ප්‍රථමාධාර වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.08.30 |
| 11 | ගෘහවිද්‍යා ගුරුවරුන් සඳහා පවත්වල ලද ආහාර මේස ආචාරධර්ම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන ( ශ්‍රී සුමන විද්‍යාලය) | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.09.12 |
| 12 | ගෘහවිද්‍යා ගුරුවරුන් සඳහා පවත්වල ලද වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.09.15 |
| 13 | ගෘහවිද්‍යා ගුරුවරුන් සඳහා පවත්වල ලද ආහාර මේස ආචාරධර්ම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන (සීවලී මහා විද්‍යාලය) | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.09.19 |
| 14 | ගෘහවිද්‍යා ගුරුවරුන් සඳහා පවත්වල ලද ආහාර මේස ආචාරධර්ම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.09.26 |
| 15 | ගෘහවිද්‍යා ගුරුවරුන් සඳහා පවත්වල ලද ආහාර මේස ආචාරධර්ම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.10.03 |
| 16 | පිළිගැනීමේ සහ ගෘහ පාලන ශිෂ්‍යයන් සඳහා පවත්ව දෙගුරු හමුව | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.10.04 |

| | | | |
|---|---|---|---|
| 17 | ක්‍රිකට් තරඟාවලිය | රත්නපුර සීවලී විද්‍යාලීය ක්‍රීඩාංගනය | 2012.10.10 |
| 18 | වෘත්තීය සූප ශාස්ත්‍ර සිසුන් සඳහා පවත්වල ලද හමුව | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.1011 |
| 19 | ආහාර හා පාන වර්ග පිළිබඳ පාඨමාලා හදාරන සිසුන් සඳහා පවත්වන ලද දෙගුරු හමුව | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.10.12 |
| 20 | ගෘහවිද්‍යා ගුරුවරුන් සඳහා පවත්වල ලද ආහාර මේස ආචාරධර්ම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන ( බෝධි මලුව මහා විද්‍යාලය) | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.10.17 |
| 20 | අයගම කොට්ඨාශයේ රැකියා වෙළඳපොල | අයගම | 2012.10.19 |
| 21 | ගෘහවිද්‍යා ගුරුවරුන් සඳහා පවත්වන ලද ආහාර මේ ආචාරධර්ම පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන (රත්නපුර මිහිඳු විද්‍යාලය) | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.10.24 |
| 22 | රැකියා වෙළඳපොල | ශාන්ත ලූකස් විද්‍යාලය | 2012.11.03 |
| 23 | ශිෂ්‍යයන් සඳහා සම්මුඛ පරීක්ෂණ | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය රත්නපුරය. | 2012.11.03 |
| 24 | රැකියා වෙළඳපොල | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 2012.11.06 |
| 25 | රැකියා වෙළඳපොල | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2012.11.08 |
| 26 | රැකියා වෙළඳපොල | කෑගල්ල | 2012.11.09 |

## පවත්වන ලද දෛනික වැඩසටහන් පිළිබඳ විස්තර.

| වැඩසටහන | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම | ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව | නිමැවුම |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | 31 | 28 | 15 | 13 |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | 36 | 34 | 18 | 16 |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | 39 | 36 | 19 | 19 |
| ශිල්ප පාඨමාලා - මුළු ගණන | 106 | 98 | 52 | 48 |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | 44 | 36 | 45 | 40 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 45 | 39 | 61 | 48 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | 55 | 46 | 68 | 56 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 48 | 38 | 36 | 32 |
| සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන | 192 | 159 | 210 | 176 |

## රත්නපුර ශ්‍රී. ලං. සං. හා. හෝ. ක. ආයතනය - මගින් හෝටල් කර්මාන්තයට හඳුන්වාදෙනු ලැබූ නවකයින් - 2012 වර්ෂය.

| සිසුන් ඇතුළත් කර ගැනීම | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | ශිල්ප මට්ටම | සහතික පත්‍ර මට්ටම | ශිල්ප මට්ටම | සහතික පත්‍ර මට්ටම |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 53 | 106 | 34 | 141 |
| නැවත ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | - | 13 | - | 62 |
| නවක ශිෂ්‍ය සංඛයාව | 53 | 93 | 34 | 79 |

## සංචාරක ව්‍යාපාර හා ආගන්තුක සත්කාර සේවයේ යහපත උදෙසා පවත්වන ලද වැඩසටහන් - 2012 වර්ෂය.

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | සංවිධානය | කාලසීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් | කොක්ටේල් සෑදීම සහ පිළිගැන්වීම පිළිබඳ ප්‍රායෝගික සැසි | 2012.01.07 | 45 |
| | රත්නපුර ශ්‍රී. ලං. සං. හා හෝ ක. ආයතනයේ සිසුන් | වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන | 2012.01.13 | 35 |
| | මහවැලි පුහුණු වැඩසටහන | උඩවලව මහවැලි කළාපය | 2012.06.30 | 25 |
| | මහවැලි පුහුණු වැඩසටහන | උඩවලව මහවැලි කළාපය | දින 04 | 25 |
| | ගෘහවිද්‍යා ගුරු පුහුණු වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය - රත්නපුරය. | දින 06 | 25 |
| | ගෘහවිද්‍යා ගුරුවරුන් සහ ශිෂ්‍යයන් සඳහා පුහුණු වැඩසටහන | ශ්‍රී . ලං. සං. හා හෝ. ක. ආයතනය - රත්නපුරය. | දින 03 | 30 |
| | ගෘහවිද්‍යා ගුරු පුහුණු වැඩසටහන | ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය - රත්නපුරය. | දින 04 | 25 |

## අධ්‍යයන / අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබාදීම - 2012 වර්ෂය.

| අංකය | අවධානය යොමුකළ ක්ෂේත්‍රය | පුහුණුව ලබාදීම | කාල සීමාව | අර්ථලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ජා. වෘ. සු. තක්සේරුකවෙකු වශයෙන් සුදුසුකම් ලැබීම | රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | දින 05 | 03 |

## 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ක්‍රමෝපා පිළිබඳ සාරාංශයක්.

1. 2012 වර්ෂයේ සියලුම වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
2. කුඩා පරිමාණ හෝටල් හිමිකරුවන් සඳහා විශේෂ පාඨමාලා.

## රත්නපුර ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය



## ශ්‍රී. ලං. සං. හා හෝ. ක. ආයතනය විසින් පිරිනමන ලද වැඩසටහන් සඳහා පැවති ඉල්ලුම.

| වැඩසටහන | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව | අයදුම්කරුවන් සංඛ්‍යාව | සුදුසුකම්ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | තෝරාගත් සංඛ්‍යාව |
| ශිල්ප පාඨමාලා - ගෘහ පාලනය | 58 | 53 | 34 | 17 | 15 | 15 |
| ශිල්ප පාඨමාලා - ආහාර හා පාන | 53 | 48 | 48 | 20 | 18 | 18 |
| ශිල්ප පාඨමාලා - සූප ශාස්ත්‍රය | 56 | 52 | 52 | 20 | 19 | 19 |
| ශිල්ප පාඨමාලා - මුළු ගණන | 167 | 153 | 134 | 57 | 52 | 52 |
| සහතික පත්‍ර පාඨමාලා - ගෘහ පාලනය | 63 | 55 | 55 | 75 | 45 | 45 |
| සහතික පත්‍ර පාඨමාලා - ආහාර හා පාන | 103 | 59 | 59 | 98 | 58 | 58 |
| සහතික පත්‍ර පාඨමාලා - සූප ශාස්ත්‍රය | 199 | 53 | 53 | 128 | 55 | 55 |
| සහතික පත්‍ර පාඨමාලා - ඉදිරිපස කාර්යාලය | 65 | 54 | 54 | 63 | 38 | 38 |
| සහතික පත්‍ර පාඨමාලා - මුළු ගණන | 430 | 172 | 221 | 364 | 196 | 196 |

# ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
# 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූලික ගිණුම්කරණ උපකල්පන සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

## 01.01 ගිණුම්කරණ නියමයන්

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම අනුගමනය කරමින් පිළියෙල කොට ඇත. ආදායම සහ පිරිවැය උපචිත කර ඒවා අදාළ කාලසීමාව යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. යෝග්‍ය පරිදි වැදගත් ගිණුම් ප්‍රතිපත්ති ඉදිරි සටහන් වල පැහැදිලි කර ඇත. ගිණුම්වලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපුම් සිදුකොට නොමැත.

## 01.02 භාණ්ඩ / තොග

පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගය මත සාමාන්‍යයෙන් තොග ගණනය කර ඇත.

## 01.03 ක්ෂයවීම්

ක්ෂය ප්‍රතිපාදන ශ්‍රී.ලං.ගි. ප්‍රමිත 18 (ප්‍රතිශෝධිත) ට අනුව පහත සඳහන් පරිදි සරල මාර්ග ක්‍රමවේදය අනුව පිරිවැය හෝ ඇගයීම මත සපයනු ලැබ ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 4% |
| විදුලි ස්ථාපනය | 5% |
| දුරකථන ස්ථාපනය | 5% |
| සවි කිරීම් | 7.5% |
| ගෘහ භාණ්ඩ | 7.5% |
| විවිධ උපකරණ | 25% |

| | |
|---|---|
| පිරියත සහ උපකරණ | 25% |
| මෝටර් රථ | 25% |
| පරිගණක සහ දත්ත සැලසුම් උපකරණ | 25% |
| පරිගණක වැඩසටහන් සහ මෘදුකාංග | 33.33% |
| කාර්යාප උපකරණ | 10% |
| වීදුරු භාණ්ඩ | 33.33% |
| හැදිගැරුප්පු සහ රිදී භාණ්ඩ | 25% |
| ලිනන් | 50% |
| මුළුතැන්ගෙයි සහ බේකරි උපකරණ | 7.5% |

01.04 බදුකරණය
-------------

1978 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 (ඒ) (xx) වගන්තිය යටතේ සංචාරක මණ්ඩලය ආදායම් බදු වලින් නිදහස් කොට ඇත.කෙසේ වෙතත්, 2002 අංක 10 දරන දේශීය ආදායම් පනත ( සංශෝධිත) අනුව සෑම කාර්තුවකටම පසුව එළඹෙන මාසයේ 20 වැනි දින වන විට වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කල යුතුය.

01.05 2005 අංක 38 දරන සංචාරක ව්‍යාපාර පනත ක්‍රියාත්මක කිරීම
-----------------------------------------------------------------

2005 අංක 38 දරන සංචාරක ව්‍යාපාර පනත 2007 ඔක්තෝබර් 01 වැනි දින සිට ක්‍රියාත්මක කරන ලදී.2005 අංක 38 දරන සංචාරක ව්‍යාපාර පනත අනුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය අවලංගු කරන ලද අතර2007 ඔක්තෝබර් 01 වැනි දින සිට පහත සඳහන් ආකාරයට නව ආයතන ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධන කාර්යාංශය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

(ආ) සංචාරක ව්‍යාපාර අරමුදල් බෙදාහැරීම

සංචාරක ව්‍යාපාර පනතේ 23 (1) වගන්තිය අනුව සංචාරක ව්‍යාපාර සංවර්ධන අරමුදල සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනයට සහ අලෙවිකරණ කටයුතු සඳහා යොදාගත යුතු වන අතර එහි කළමනාකරණය සහ පරිපාලන ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර සංවර්ධන අධිකාරිය විසින් ඉටු කරනු ලබයි. සංචාරක ව්‍යාපාර පනතේ 24(8) වගන්තිය ප්‍රකාර අරමුදල් පහත සඳහන් පරිදි බෙදාහැරිය යුතුය.

| | |
|---|---|
| ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර සංවර්ධන අධිකාරිය | 14% |
| ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධන කාර්යාංශය | 70% |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | 12% |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 04% |

01.05.1 කෙරීගෙන යන වැඩ.

ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින ව්‍යාපෘති වලින් රු.22,405,177.64 ක් වූ කෙරීගෙන යන වැඩ අගය නිරූපනය කෙරේ.

01.06 පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව සියලුම සේවකයන් සඳහා සේවානියුක්ත වසරේ සිට අදාළ වන පරිදි ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගිණුම්වල වෙන් කර ඇත.

# ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය
# 2012 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

Amount/Rs.

| | 2012 | 2011 |
|---|---|---|
| **මෙහෙයුම් නටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| ශුද්ධ අතිරික්තය / ( ඌණතාවය) | 53,580,402.43 | 55,649,409.72 |
| **මුල්‍ය නොවන සංචලන** | | |
| ක්ෂයවීම් | 32,530,065.75 | 36,780,515.83 |
| පාඩු / කපා හැරීම් | (772,218.70) | (772,218.70) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 1,422,227.00 | 1,353,002.60 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය | 86,760,476.48 | 93,010,709.45 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්.** | | |
| භාණ්ඩතොග (වැඩිවීම) / අඩුවීම | (259,839.04) | (51,030.08) |
| වෙළඳ ණයගැතියෝ ( වැඩිවීම) / අඩුවීම | (2,066,156.01) | (7,339,763.71) |
| තැම්පතු සහ වෙනත් ලැබියයුතු ( වැඩිවීම) / අඩුවීම | (440,000.00) | |
| එස්.එල්.ටී.ඩී.ඒ. සහ එස්.එල්. ටී. පී. බී. ලැබියයුතු ( වැඩිවීම) / අඩුවීම | (10,282,119.64) | (17,814,904.32) |
| පූර්ව ගෙවීම්( වැඩිවීම) / අඩුවීම | (6,953,129.82) | 535,572.70 |
| ණය සහ අත්තිකාරම්( වැඩිවීම) / අඩුවීම | 524,782.46 | (228,518.80) |
| ගෙවිය යුතු තැම්පතු ( වැඩිවීම) / අඩුවීම | 911,438.84 | (1,253,196.77) |
| අනෙකුත් ගෙවීම් ( වැඩිවීම) / අඩුවීම | 2,723,062.07 | 1,089,895.48 |
| උපචිත වියදම් ( වැඩිවීම) / අඩුවීම | 11,567,369.00 | 4,595,197.95 |
| | (4,274,592.14) | (20,466,747.55) |
| **මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය.** | **82,485,884.34** | **72,543,961.90** |
| **ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | |
| පාරිතෝෂිත ගෙවීම්. | (425,272.50) | (391,022.58) |
| දේපළ, පිරියත සහ උපකරණ | (47,046,598.29) | (68,442,854.59) |
| **ආයෝජන කටයුතුවල ශුද්ධ මුදල් භාවිතය** | **(47,471,870.79)** | **(68,833,877.17)** |
| **මුදල් සහ මුදල් සමාන වස්තුවල ශුද්ධ වැඩිවීම.** | **35,014,013.55** | **3,710,084.73** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන වස්තු** | **99,902,034.36** | **96,191,949.63** |
| **කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන වස්තු** | **134,916,047.91** | **99,902,034.36** |

# SRI LANKA INSTITUTE OF TOURISM & HOTEL MANAGEMENT

## Statement of Financial Position

### as at 31 December 2012

Amount/Rs.

| | Note | 2012 | 2011 Restated |
|---|---|---|---|
| **ASSETS** | | | |
| **Current Assets** | | | |
| Inventories | 03 | 1,963,578.97 | 1,703,739.93 |
| Trade Debtors | 04 | 14,581,666.42 | 12,515,510.41 |
| Deposits & Other Receivables | 05 | 3,737,313.93 | 3,297,313.93 |
| Receivables SLTDA & SLTPB | 06 | 61,381,826.86 | 51,099,707.22 |
| Loans & Other | 07 | 8,063,816.66 | 8,363,079.62 |
| Advances | 08 | 449,851.00 | 675,370.50 |
| Pre payments | 09 | 7,062,769.29 | 109,639.47 |
| Cash in Hand and at Bank | 10 | 134,916,047.90 | 99,902,034.36 |
| **Total Current Assets** | | 232,156,871.03 | 177,666,395.44 |
| **Non- Current Assets** | | | |
| Property, Plant & Equipment | 02 | 572,308,458.33 | 491,837,152.47 |
| Less : Provisions for Depreciation | | 170,084,601.32 | 137,554,535.58 |
| **Written down value** | | **402,223,857.01** | **354,282,616.89** |
| Add : Work in progress | | 22,465,177.65 | 55,889,885.22 |
| **Total Non- Current Assets** | | 424,689,034.66 | 410,172,502.11 |
| **Total Assets** | | **656,845,905.69** | **587,838,897.55** |
| **LIABILITIES** | | | |
| **Current Liabilities** | | | |
| Deposits / Other payables | 11 | 2,526,810.73 | 1,615,371.89 |
| Payables to SLTDA & SLTPB | 12 | 6,657,304.26 | 3,934,242.19 |
| Accrued expenses | 13 | 27,672,133.63 | 16,104,764.63 |
| Provisions for Retirement Gratuity | 14 | 11,910,882.00 | 10,913,927.50 |
| **Total Current Liabilities** | | 48,767,130.62 | 32,568,306.21 |
| **Net Assets** | | **608,078,775.07** | **555,270,591.34** |
| **NET ASSETS/EQUITY** | | | |
| Capital Contribution | | 454,850,951.89 | 454,850,951.89 |
| Revenue Account | | 139,458,544.58 | 85,878,142.15 |
| JABIC & UNDP Grant | | 13,769,278.60 | 14,541,497.30 |
| **Total Net Assets/Equity** | | **608,078,775.07** | **555,270,591.34** |

| | | |
|---|---|---|
| Chandra Mohotti | G.S.Wijewardane | L. Ratnayake |
| **Chairman** | **Director General** | **Director Finance** |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: ටීඑම්/කේ/එස්එල්අයිටීඑච්එම්/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2013 දෙසැම්බර් ²⁶ දින.

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2013 ජූලි 15 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223

ඉලෙක්ට්‍රොනික තැපැල් / மின்னஞ்சல் / E-mail: oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්,භාවිතයට නොගන්නා වත්කම් සහ භාවිතයෙන් ඉවත් කරන ලද වත්කම් වෙනම හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම ලෙස රු.32,530,066 හඳුනාගෙන තිබුණි.

(ආ) එක් එක් හෝටල් පාසල් ශාඛා සඳහා වෙනමම ආදායම් ප්‍රකාශන පිළියෙල කර තිබුණද, ප්‍රධාන කාර්යාලයේ වියදම් හෝටල් පාසැල්වලට විභජනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. මෙයට අමතරව,සමුද්‍රා හෝටලයට සෘජු හා වක්‍ර පොදු කාර්ය වියදම් විභාජනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

#### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) වෙළඳ ණයගැතියන් අතුරින් රු. 9,555 378 ක් වර්ෂ 01කට වැඩි කාලයක සිට හිඟව පැවති අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.5,092,956 ක් වර්ෂ 01කට වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි.

3

(ආ) විවිධ ණයගැතියන් අතරින් රු.3,934,242 ක් තරඅ වශයෙන් හඳුනා නොගැනීම හේතුවෙන් 2007 වර්ෂයේ සිට නොපියවා පැවතුණි.

(ඇ) කාර්ය මණ්ඩලයට ලබාදී තිබුණු රු.404,851 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් පියවා නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන ගිණුම් විෂයන් ඉදිරියෙන් සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණයගැතියෝ | 14,581,666 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| ආපනශාලා විකුණුම් | 4,593,426 | විකුණුම් ලියකියවිලි |
| දේපල පිරියත සහ උපකරණ | 572,308,458 | i. භෞතික සත්‍යාපන වාර්තා<br>ii.ස්ථාවර වත්කම් ලේඛන |
| විකුණුම් පිරිවැය(සමුද්‍රා හෝටලය) | 6,987,145 | තොග ගැලපුම් විස්තර |
| ලැබිය යුතු තැන්පතු | 2,234,312 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| වෙනත් ලැබිය යුතු ශේෂය | 1,503,002 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| ශ්‍රී ලංකා සංචාරක අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය | 61,337,343 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු ශේෂය | 4,417,949 | ශේෂය සනාථ කිරීමේ ලිපි |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ශේෂය | 6,657,304 | ශේෂය සනාථ කිරීමේ ලිපි |

4

## 2.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති.රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 14(10) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ කාර්ය සාධනය දක්වමින් කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් පිළියෙළ කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 4.2.2 වගන්තිය | මාසික කාර්ය සාධන වාර්තා, මෙහෙයුම් ප්‍රකාශන, ප්‍රසම්පාදනය කරන ලද ද්‍රව්‍යවල වටිනාකම ,මානව සම්පත් වාර්තා , ණයගැති, ණය හිමි හා තොග කාල විශ්ලේෂණ සහ චලනය නොවන, සෙමින් චලනය වන සහ අභාවිත තොග පිළිබඳ වාර්තා පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 9.12 වගන්තිය | සේවකයන් සඳහා වූ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii) 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාල රීති හා රෙගුලාසි ඇතුළත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිත පරිපාටි සංග්‍රහය භාණ්ඩාගාර ලේකම්වරයාගේ එකඟත්වය සහිතව පිළියෙල කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) සහ (ඇ) මාර්ගෝපදේශ | අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් ආවරණය වන පරිදි ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | ආයතනය සතු පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |

2.2.5 අධිකාරි බලය නොළත් ගනුදෙනු

අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වෙන්කළ වාහන පහසුකම ලබාගැනීම සඳහා හිමිකම් නොලබන තනතුරු 3ක රාජකාරියේ නියුක්ත නිලධාරීන් තිදෙනෙකුට 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ප්‍රවාහන සහ ඉන්ධන දීමනා වශයෙන් රු. 3,551,640 ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවලින් රු.53,580,403 ක අතිරික්තයක් වූ අතර ,ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.55,649,410 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.2,069,007 කින් අඩුවී තිබුණි. පසුගිය වර්ෂයට වඩා රු.31,411,357 කින් වියදම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ආදායම රු.මිලියන 294 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු.මිලියන 265 සමඟ සැසඳීමේදී සියයට 10.9ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ ඉගැන්වීම්, පුහුණු කිරීම් හා සංවර්ධන කටයුතු වෙනුවෙන් වැය කර තිබුණු රු.මිලියන 209 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු. මිලියන 241 ක් වැය කර තිබුණි. ඒ අනුව සියයට 14.8 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

6

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 හෝටල් පාසැල්වල කාර්ය සාධනය

සිසුන් පුහුණු කිරීම (අභ්‍යන්තර) පිළිබඳ කාර්ය සාධනය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ ලියාපදිංචි මුලු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පාඨමාලාව සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 551 ක් හෙවත් සියයට 94 කි. 2011 වර්ෂයේ ලියාපදිංචිවූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් පාඨමාලාව සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 96 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඒක සිසු පිරිවැය රු. 437,005 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු.147,242 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්මට අනුව වර්තමාන සංචාරකයන්ගේ පැමිණීම වන මිලියන 1.005 ක ප්‍රමාණය හා සැසඳීමේදී 2016 වන විට සංචාරක පැමිණීම මිලියන 2.5 කින් වර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවත්, ඉහත ඉලක්කයට සමගාමීව කර්මාන්තයේ සමස්ථ අරමුණු ලඟා කරගැනීමට අවශ්‍ය මානව සම්පත් අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් උපායමාර්ග සැළසුම් සකස් කර නොතිබුණි.

4.2 අරමුදල් ඌණ උපයෝජනය

දුර්වල මූල්‍ය කළමණාකරණය හේතුවෙන් රු. මිලියන 99 සිට රු. මිලියන 134 අතර වූ පරාසයක බැංකු ශේෂයන් සමාලෝචිත වර්ෂය මුළුල්ලේම නිශ්කාර්යව තිබුණි.

4.3 නිෂ්ක්‍රිය වත්කම්

සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2008 ජනවාරි මාසයේදී මිලට ගත් වටිනාකම රු.11,929,385 ක් වූ හෝටල් උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිෂ්ක්‍රියව තිබුණි.

7

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන්, පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමෙන් හා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව, සමුද්‍ර හෝටලයේ කාමර නවීකරණය කර තිබුණි. ඉදිකිරීම් වැඩ පෞද්ගලික සමාගමකට රු. මිලියන 51 ක් වූ ඉදිරිපත් කළ මිල ගණන මත පවරා තිබුණි. නිම කරන ලද ඉදිකිරීම් නිසි ප්‍රමිතියකට නොතිබුණි.

## 4.5 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ගුණාත්මකභාවය සහ විශ්වාසවන්තභාවය

සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂ දෙක තුළදී පරිගණක හා පරිගණක මෘදුකාංග මිලදී ගැනීම සඳහා රු. මිලියන 30 ක් වැය කර තිබුණද, ආයතනයේ කළමනාකරණ තොරතුරුවල අවශ්‍යතාවය හඳුනාගෙන විධිමත් තොරතුරු පද්ධතියක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ස්ථාපිත කර නොතිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

සමුද්‍ර හෝටලයේ කාර්ය මණ්ඩලයද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය 117 ක් විය. කථිකාචාර්යවරුන් 6 ක් ද ඇතුළත්ව පුරප්පාඩු සංඛ්‍යාව 48 ක් විය. පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## 4.7 ප්‍රවාහන ඇණිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වාහන 02ක් සඳහා ඉන්ධන,නඩත්තු හා අළුත්වැඩියා වියදම් සඳහා රු.4,142,205 ක් වැය කර තිබුණි. එසේ වුවත්, එම වාහන ධාවනය කළ දුර ප්‍රමාණයන්වල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කුලී පදනම මත යොදාගත් වාහන සඳහා රු.10,532,634 ක මුදලක් වැය කර තිබුණි. තවද කුලියට ගත් වාහන ධාවනය කළ දුර පිළිබඳ අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 5. ගිණුම් කටයුතුකරණය හා ගණකාධිකරණය

### 5.1 සංයුක්ත සැලැස්ම

2011 සිට 2016 වර්ෂය දක්වා ආයතනය [illegible]

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයට අදාළව [illegible] ක්‍රියාකාරී සැලැස්මක් [illegible] නොමැත.

### 5.3 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොමැත.

### 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් [illegible] වැය විෂයන් 28 ක විචලනය, සියයට 52 සිට සියයට 981 දක්වා පරාසයක වී තිබුණි. [illegible] අයවැය ලේඛනය [illegible] නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
(ආ) අයවැය පාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) අත්තිකාරම් ගෙවීම
(උ) ගිණුම්කරණය

එච්.ඒ.එස් සමරවීර
විගණකාධිපති.

10